# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

## මැයි මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.

**COVID-19 වසංගතයේ තුන්වන රැල්ල මගින් ඇතිවූ අහිතකර බලපෑම් හේතුවෙන් මැයි මාසය තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම් පහළ යන ලදී.** නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2021 මැයි මාසයේදී දර්ශකාංක 2.2 කින් පහළ යමින් 42.1 ක් ලෙස වාර්තා වූ අතර, නිෂ්පාදන, සේවා නියුක්තිය, නව ඇණවුම් සහ තොග මිලදී ගැනුම් උප දර්ශක වල සිදුවූ සැලකිය යුතු පහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

අනුමැතියෙන් තොර නොපැමිණීම් තවදුරටත් ඉහළ යාම නිසා සේවා නියුක්තිය පහත වැටීමත් සමගම විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ යන ලදී. තවද, මැයි මස මැද භාගයේ සිට පැනවූ සංචරණ සීමාවන් මධ්‍යයේ, සේවක පැමිණීම් සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් නිෂ්පාදන සැලසුම් නියමිත දිනට සම්පූර්ණ කරගැනීමේදී විශාල ලෙස බාධා ඇතිවූ බව එම අංශවල ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙක් අවධාරණය කරන ලදී.

| විචල්‍යය | අප්‍රේල් | මැයි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **44.3** | **42.1** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 44.3 | 42.4 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 33.0 | 27.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.9 | 38.4 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 40.9 | 36.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 64.8 | 73.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

උත්සව සමයේ පැවති ඉහළ ඉල්ලුම සමනය වීම සහ වසංගත තත්ත්වය නැවත පැනනැගීමත් සමගම, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නව ඇණවුම් මෙම මාසය තුළ පහළ යන ලදී. මෙම තත්ත්වයන් සහ අමුද්‍රව්‍ය තොග අඩුවීමට සමගාමීව, සමස්ත තොග ගැනුම් පහළ යන ලදී.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021 මැයි මාසය තුළ වැඩි වේගයකින් ඉහළ ගිය අතර, ආනයනයේදී හා දේශීය සැපයුම් ජාලයන්ගේ සිදුවූ ප්‍රමාදයන් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, නැව් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍යවල පිරිවැය ඉහළ ගිය අතර ඔවුන්ගේ ලාභාන්තිකයට අහිතකර ලෙස බලපෑම් සිදුවූ බවද බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී.


COVID-19 එන්නත් කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය සහ සංචරණ සීමාවන් හේතුවෙන් වසංගත තත්වයේ අඩු වීමක් බලාපොරොත්තුවන අතර, ඒ සමඟ ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වනු ඇතැයි යන අපේක්ෂාවත් සමඟ ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන්ගේ උප දර්ශකය ඉහළ ගොස් ඇත.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**42.1**

**2021 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.2 පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.2 කින් ඉහළ යමින් 2021 මැයි මාසයේදී 56.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 මැයි මාසයේදී එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, රුසියාව, යුරෝපා කලාපය සහ චීනයෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් ඉහළ ගිය අතර, ඉන්දියාවේ එම දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 ජුනි 14 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුළුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**COVID-19 වසංගතයේ තෙවන රැල්ල ක්‍රමයෙන් වර්ධනය වීමට සමගාමීව, 2020 අප්‍රේල් මාසයෙන් පසුව වාර්තා වූ අවම අගය වාර්තා කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 මැයි මාසයේ දී 39.5ක් දක්වා තවදුරටත් පහළ ගියේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි දක්නට ලැබුණු පහළ යෑම් හේතු විය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණු පහත වැටීම් හේතුවෙන් සේවා අංශයේ නව ව්‍යාපාර 2021 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2021 මැයි මාසයේ දී වැඩි වේගයකින් පහළ ගියේය. කෙසේ වුවද, නව COVID-19 ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීමත් සමඟ මහජන සෞඛ්‍ය කටයුතු උප අංශය වර්ධනය විය.

සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල තියුණු පහළ යෑමක් 2021 මැයි මාසයේ දී දක්නට ලැබුණි. COVID-19 වසංගතයේ තෙවන රැල්ල පැතිරීම පාලනය කිරීම සඳහා පනවා ඇති සංචරණ සීමා මධ්‍යයේ අත්‍යවශ්‍ය නොවන දෑ සඳහා වන ඉල්ලුම පහත වැටීම සහ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා ඇති බාධාවන් හේතුවෙන් සියලුම උප අංශයන්හි පාහේ පහත වැටීම් නිරීක්ෂණය විය. තොග හා සිල්ලර වෙළඳාම, අනෙකුත් පෞද්ගලික සේවා, නවාතැන් හා ආහාරපාන සැපයීම සහ වෘත්තීය සේවා යන උප අංශ සමස්ත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි පහළ යෑමට වැඩි වශයෙන් දායක විය. එසේ වුවද, මහජන සෞඛ්‍ය කටයුතු සහ තොරතුරු තාක්ෂණ වැඩසටහන් උපදේශනය හා සම්බන්ධ කාර්යයන්හි ව්‍යාපාරික ක්‍රියාකාරකම් පසුගිය මාසයට සමාන මට්ටමක පැවතුනි.

විශ්‍රාම යෑම්, සේවයෙන් ඉවත්වීම් සහ සේවා කොන්ත්‍රාත් කල් ඉකුත්වීම් මධ්‍යයේ නව බඳවා ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් සේවා නියුක්තිය 2021 මැයි මාසයේ දී අඛණ්ඩව පහළ ගියේය.

ප්‍රාදේශීය හුදකලා කිරීම් අඛණ්ඩව පැවතීම සහ මාසයේ අග භාගයේ දී දිවයින පුරා සංචරණ සීමා පැනවීම හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් 2021 මැයි මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

| විචල්‍යය | අප්‍රේල් | මැයි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **48.9** | **39.5** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 48.9 | 36.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 47.9 | 28.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 48.4 | 32.8 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 54.4 | 60.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 44.7 | 38.6 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


COVID-19 වසංගතය තීව්‍ර වීමත් සමඟ වර්ධන අපේක්ෂාවන් පිළිබඳ ව්‍යාපාරිකයන් තුළ ඇති අපැහැදිළි දැක්ම හේතුවෙන් ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2021 මැයි මාසයේ දී තවදුරටත් පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**39.5**

**2021 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 9.4ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 අප්‍රේල් මාසයේ පැවති 57.0 සිට 2021 මැයි මාසයේ දී 59.4 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 මැයි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ඉන්දියාව සහ ජපානය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 ජූනි 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.